

එච්.ආර්. ජෝතිපාල ගුණදාස අමරසේකර එරෙහිව සුනිල් ආරියරත්න

''මම බුද්ධිමතෙක් නෙමෙයි. මම පණ්ඩිතයන්ට කීකරු කෙනෙක් නෙමෙයි. මගේ අවසාන වෙලෙදාළ ප්‍රේක්ෂකයෝ. මම දීර්ඝ කාලයක ඉඳන් ඈතේ මෙතන ඉන්නවා. සාමාන්‍ය මිනිස්සු කියනවා නම් මම හොඳයි කියලා....ඊට වැඩිය වෙන දෙයක් තියෙනවාද?'' දකුණු ඉන්දියාවේ සුප්‍රකට නම් ''කමලා හසන්'' මෙගම ප්‍රකාශ කර තිබුණේ ඔහුගේ ''අපූර්ව සගෝ දරගල්'' නම් චිත්‍රපටය ගැන ''ද ගින්දු'' පත්‍රය සමග පැවැත්වූ සාකච්ඡාවකදීය. මෙම කියමනත් සමග එච්.ආර්. ජෝතිපාල නම් ගායකයා නිරන්තරයෙන් මතකයට එනවා. ඔහුදු වරක් මීට සමාන ප්‍රකාශයක් කර තිබුණා. ඔහුට එරෙහිව විදුරුග විවේචකයන්ගේ අසීමිත ප්‍රහාරයන් සතර අතින් එල්ල වුවා. ඔහුගේ මරණයත් සමග මේ සේනාංක අතර යම් තරමක මත ගැටුමක් ඇරඹුණා. එච්.ආර්. ජෝතිපාල ගැන තිබූ ජන පදනම පිළිබඳව නිවැරදි තක්සේරුවක අවශ්‍යතාවය තේරුම් ගැනීමටද ජනතාවගේ සැබෑ ආරක්ෂණයේ මාධ්‍ය සෙවීමටද විය. කෙසේ නොකඩවා පවත්වාගෙන ඒමේ උරුමය ලැබුණේ කෙලෙසින්ද? අප දන්නයන් පිළිබඳව සාධාරණ විමර්ශනයක් යොමුවුණා. ඇත්ත වශයෙන්ම මෙය කෘතඥතා ගුණය අහක්කරන්න ඉල්ලීමක එලයක්ද වූවා.

කෙසේ වුවත් මෑතදී මහාචාර්ය සුනිල් ආරියරත්නයන් සිය ඔස්ට්‍රේලියානු සංචාරයේ දී මොනෙෂ් සරසවිදේදී ඒ ගැන මෙසේ සඳහන් කළා. ''එච්.ආර්. ජෝතිපාල මළවුන්ගෙන් උපද්දන්න අපේ රටේ මෑතක උත්සාහයක් තිබුණා. නමුත් ඒක හරියන්නේ නැහැ. මොකද එච්.ආර්. ජෝතිපාලගෙන් ගීත සාහිත්‍යයට වූ සේවයක් නැති ගින්දා.'' සුනිල් ආරියරත්නයන් එසේ කිවද, ඒ සම්බන්ධව බොහෝ විචාරකයන් ප්‍රතිවිරුද්ධ මත දරමින් සිටිනවා.

ආන්දෝලනාත්මක සිනමා අධ්‍යක්ෂක ''අසෝක හඳගම'' මෙසේ ප්‍රකාශ කර සිටිනවා. ''දේශීය සිනමාවේ ස්වර්ණයය අවධිය 60-70 දශකයයි. සිනමා ශාලාවල සෙනග රැස් කෑ යුගය මෙයයි. මේ ජනප්‍රිය සිනමාව පෝෂණය වූයේ කවුරුන් අතින්ද? දියුණු රංගනයෙන් ''ගාමිණී ෆොන්සේකා'', ''මාලනී ෆොන්සේකා, කමෙරාකරණයෙන් ''විජි බීල්ගේ'', ''එච්.එස්. ආනන්ද'' , ''බොනල්ඩ් කරුණාරත්න'', සංස්කරණයෙන් ''ධර්මස් තොවත්ත'', තිර රචනයෙන් ''තිස්ස අබේසේකර'', සංගීතයෙන් ''ප්‍රේමසිරි කේමදාස'', ගීත රචනයෙන් ''කරුණාරත්න අබේරත්න'' අධ්‍යක්ෂණයෙන් ''ලෙස්ටර් ජේම්ස් පීරිස්'' නා ගායනයෙන් එච්.ආර්. ජෝතිපාල වැන්නවුන් අතිකි. මොවුහු කෘතඥත්ව වාතතිකයෝ වූහ. (බලය - මාර්තු 2004 කලාපය) මෙහිදී අසෝක හඳගමයන් එච්.ආර්. ජෝතිපාලයන් සසඳන්නේ ලංකාවේ අනුගතය කලාකරුවන් අතරේ තමමිනි. ඇත්තෙන්ම ඔහු ගායකයෙකු ලෙසින් නොව සටහන් කරන්න්, ගායන ක්ෂේත්‍රයේ වාතතිකයෙකු ලෙසිනි. එසේම දේශීය සිනමා කර්මාන්තයට ජෝතිපාලයන් අතින් වූ සේවාව අගය කරමිනිය. මහා සංගීතඥ ප්‍රේමසිරි කේමදාසයන් මෙසේ ප්‍රකාශ කර සිටිනවා. ''එච්.ආර්. ජෝතිපාලයන් මවත ඔහුටම හිමි අපරාජිත හඬ විස්මය දනවන්නකි.'' යනුවෙනි. එසේම ප්‍රවීණ කවියෙකු වන ''පරාතුමා කොඩිතුවක්කු මෙසේ පවසනවා. 'ඇත්ත වශයෙන්ම එච්.ආර්. ජෝතිපාලගේ හඬ

විචාරය

යනු පොදු ජනතාවගේම හඬ මිස අන් කිසිවක් නොවේ.'' බොහෝ විචාරකයන් එච්.ආර්. ජෝතිපාලකයන්ව හඳුන්වන්නේ ගායනයක් නොව ගායන පෞරුෂත්වයක් ලෙසිනි.

ඉහත විවේචන මධ්‍යස්ථ විමසුමකට භාජනය කිරීමේදී මෙසේ සඳහන් කළ හැක. සුනිල් ආරියරත්නයන් ගායනයෙහි නොවේ. ගීත රචකයෙකි. ප්‍රේමසිරි කේමදාසයන් සංගීතඥයෙකු විනා ගායකයෙකු නොවේ. පරාතුමා කොඩිතුවක්කු කවියෙකි. අසෝක හඳගම සිනමා කරුවෙකි. ගායකයන් නොව මේ සියලුදෙනාගේ අදහස් විමසීමේදී මහාචාර්ය සුනිල් ආරියරත්නයන්ගේ අදහස එතරම් බරටැමේ ළෙස සැලකිල්ලට ගත යුතු නොවේ. මන්දැ අනෙක් ප්‍රවීණයන් සියල්ල ජෝතිපාල ගැන දරණුයේ වෙනස් අදහසක් තිසාය. අවසාන වශයෙන් සුනිල් ආරියරත්නයන්ට මෙසේ කිව යුතුය. ජෝතිපාල කිසිදිනෙක මිය ගියේවත්, මරණයෙන් උපද්දන්නට අවශ්‍ය වන්නේත් නැත යනුවෙනි. මන්දැ ජෝතිපාලයන් බොහෝ ජනතාව තුළ සදාකාලිකව ජීවත් වන්නෙකු බැවිනි. එසේම සුනිල් ආරියරත්නයන්ම පවසන ගීත සාහිත්‍ය පොතේ ''අ''බොහෝදෙනා කියවූයේ එච්.ආර්. ජෝතිපාලයන් හරහාය.

ලිපියේ දෙවන කොටස සම්බන්ධ වන්නේ මහාචාර්ය සුනිල් ආරියරත්නයන් සමග වූ ''සිංහල කවිය'' පිළිබඳ වූ සංවාදය පිළිබඳවය. එය මතුවූයේ මෙලෙසෙනි. ''ගුණදාස අමරසේකයන්''ගේ ''අසක් දා කව'' ගී ඇති ''පුරන් වී ගිය සිංහල කවි කෙත'' නම් ලිපියේ වූ අන්තර්ගතය සම්බන්ධවය අමරසේකරයන් කවිය පිළිබඳ මෙසේ කියයි. ''ජෝරාදලිනිය තිසදැස් කවි ලිඛිතා මෝරාගෙන එන අවධියෙහි මම එකඳ පල වූ සඟරාවකින් මෙසේ ලිඛෙමි. ''තිසදැස'' සිංහල කවි කෙතෙහි පහළ වූ වල් පැළඳෙවියකි. ඒ ලිපිය ලියන අවස්ථාවෙහි මේ වල්පැළඳෙවිය මඟ දිගෙක කවි කෙත වසා සිටින වල් කැළයක් බවට පත්වනු අතැයැයි මගේ සොයිතුවෙමි. එහෙත් එය දැන් සිදුවී තිබේ. .... සිංහල කවි කෙත මේ වල්පැළඳෙවි ගොන්න නම් ''ගේය සාහිත්‍යය'' යන සාවම්බර නාමයෙන් හඳුන්වනු ලබන සිංදුවයි. අද සිංහල කවිය සිංදුවකින් අවසාන වී තිබේ. කවියත්, සිංදුවත් අතර වෙනසක් අතිය යන්න. ඒවා නිර්මාණය කරන්නන් මෙන්ම සේවනය කරන්නන්ද, නොදැකිත බවකි අපට පෙනෙන්නේ.'' ඔහු තවදුරටත් මෙසේ කියනවා. ''තිසදැස් කරුවන් කී ''සේවයා සිද්ධ'' විරිතට අනුව ඒවා කියවන්නට බැරි නම් ඒවා සිංදු ලෙස කියවන්නට තැත් කිරීම යුක්ති සහගත නොවේද? ඉක්බිතිව ඒවා සිංදු තනු ගියේ තියාගන ලිවීමට පෙළඹීම විළුත අතිවාරීය සියවර නොවේද? කවින් ගීත රචකයින් බවට ක්‍රමයෙන් පත්වූයෙන්, කවිය සිංදුවෙන් අවසාන වූයේත් මේ නියාම දහම අනුවයි.'' (අසක් දා කව - 55,56 පිටුව)

මේ සංවාදයේ දී සුනිල් ආරියරත්නයන් පවා අද සිංහල කවිය පිරිහී ඇති බවද, ඒ සඳහා ගීතය යම් ආකාරයක බලපෑමක් සිදුකොට ඇති බවද පිළිගන්නේය. නමුත් ප්‍රශ්නය එය නොවේ. ඉහත ඉන්වයේ ඇති අන්තර්ගතය අනුව සිංහල කවිය පිරිහීමට ගේය පද රචනාකරුවන්ව ඇතිබිල ලිඛ වන්නේ නම් සුනිල් ආරියරත්නයන්ද, ඊට ඇතැළත් වන්නේ තිතැසිනිය. සුනිල් ආරියරත්නයන් එම ගැටළුවට සෘජු පිළිතුරක් නොදුන් අතර ගුණදාස අමරසේකරයන්ගේ ''අසක් දා කව'' අසාර්ථක කෘතියක් බව ප්‍රකාශ කළේ ය. එච්.ආර්. ජෝතිපාලය ගැන මෙන්ම මෙම ප්‍රකාශයද, විශේෂාසිතයන්වයෙන් තොරය. අමරසේකරයන්ගේ 'අසක් දා කව'' පිළිබඳව ප්‍රවීණ විචාරකයෙකු වන ''ඒරක් ඉලයප්ආරච්චි'' සෙයුර ප්‍රකාශ කරයි. ''නූතන සිංහල කවිය වෙනුවෙන් භාෂාවක්, කාව්‍ය කෘතියක් හා නිර්මාණ ස්වරූපයක් තනු කොළඹ කවිය, ගෙළ හවුල් කවිය, නිසදැස්, ස්කර කවිය, සයුක්ත කවිය, ගේය පද සාහිත්‍යය ආදිය ඉක්මවූ අන්තර්ගතයක් හා කාව්‍යයමය අනුභූතියක් ගොඩ නැංවීමටද අමරසේකරයන් ගේ මේ නූතනවාදී ව්‍යාපෘතියේ සංවිධානක අරමුණ විය. තවදුරටත් ''සිංහල හිඳහස් කවියේ සාරල මිතික ප්‍රකාශයන්ගේ එරෙහිව යමින් අමරසේකර පෙන්වා දෙන්නේ අරිට සම්පන්න හා භාව සම්පන්න සිංහල කවියක් නිර්මාණය කිරීමේලා සිංහල කාව්‍ය සම්ප්‍රදාය අනුගමණය කිරීමේ අවශ්‍යතාවයයි.'' (බලය - මාර්තු 2004 - 47, 49 පිටු) අමරසෙ-කරයන් ගැන පරාතුමා කොඩිතුවක්කු මෙසේ කියනවා. විශිෂ්ටතම කවියකු වූ ගුණදාස අමරසේකරයන් ගෙන් සිංහල කවියට ලැබුණේ අපමාණ ප්‍රභාෂ්වර බලපෑමක් බව මඟු නැවත නැවතත් මේ මතින් අපූර්වව ඔප්පු කර තිබෙනවා. (ලංකාදීප 2001 ජූලි 15)

එසේම මහාචාර්ය විමල් දිසානායක සිය 'අසක් දා කව'' සම්ප්‍රදාය හා නවීන චින්තන ලෝකය'' නම් ලිපියේ මෙසේ පවසනවා.

''අසක් දා කව'' විවිධාකාරයෙන් සම්ප්‍රදායට සම්බන්ධ වේ. භාෂාව තුළින් සම්ප්‍රදාය ඉදිරියට ගලා යන ආකාරය වඩාත් කර ගැනීමට ''ගඩමේ'' ගේ ලිපි ලේඛන ප්‍රයෝජනවත් වේ.

''ගඩමේ'' ට හා ''අමරසේකර''ට පොදු වූ මෙම චින්තන රටාව 'අසක් දා කව'' වටහා ගැනීමට උපකාරී වේ. චිරන්තන කාව්‍ය භාෂාව මුළුකොට ගෙන නිර්මිත රූපආර්ථවත් බස් වහරක් පමණක් නොව ඉහත සඳහන් කළ නවීන චින්තනය, කාව්‍යයෙහි සංකේතමය ලෝකයාට පිවිසෙන අයුරුද දැක ගත හැකිය. මෙහි අත්තේ පරාණි කවි බස මත නව රූපාර්ථවත් භාෂා මාධ්‍යයක් බිහි කිරීමෙයි.'' එය අපූරු වසඟයකි. (දිවයින 8.02.2004) එසේ නම් සුනිල් ආරියරත්නයන් ''අසක් දා කව'' අසාර්ථක කෘතියක් බව ප්‍රකාශ කළේ ඇයි? එයට හේතුව සිංහල කවියේ විනාශයට ගේය පද රචකයන් වගකිව යුතුයැයි අමරසේකර කරණා ප්‍රකාශයයි. ඒ හැර අන් පදනමක් නැත. මෙම පදනම මත සුනිල් ආරියරත්නයන් කරන විවේචන වල විශ්වාසනීයත්වය පළුදු වෙයි. ඒවා සත්‍යය නොවේ.

අවසාන වශයෙන් සුනිල් ආරියරත්නයන් ගීත කලාව සම්බන්ධව, චෝදනාත්මක දබරැයිගිල්ල එච්.ආර්. ජෝතිපාලයන් වෙතට දිගු කරද්දීම, පිටුපස හැරී බැලුවේ නම් සිංහල කවියේ විනාශය සම්බන්ධව ගේය පද රචනාකරුවන්ව දිගු වී ඇති චෝදනාත්මක ඇඟිල්ල තමා දෙසට එල්ල වී තිබෙනු දැක ගත හැකි වනු ඇත. ඒ කෙසේ වුවත්, ජර්මනි සිනමාකරුවකු වන ''ව්ම් වෙන්ඩර්'' ගේ කියමනක් සටහන් කළ යුතුය. ඒ මෙසේය. ''අද විචාරය කියන්නේ කාණු පල්ලේය.'' මෙය ලංකාව වෙනුවෙන් කෙසේ විග්‍රහ කළ යුතුද?

''එච්.ආර්. ජෝතිපාල මළවන්ගෙන් උපද්දන්න අපේ රටේ මෑතක උත්සාහයක් තිබුණා. නමුත් ඒක හරියන්නේ නැහැ. මොකද එච්.ආර්. ජෝතිපාලගෙන් ගීත සාහිත්‍යයට වූ සේවයක් නැති ගින්දා.''

මහාචාර්ය සුනිල් ආරියරත්න

ලක්ෂ්මන් වැලිවිටිය.
Barrister & Solisitor

34 පිටෙන්

වඩා යෝග්‍ය ක්‍රමයයි.

විදේශ වල ජීවත් වන විශ්‍රාමිකයන් තම වැටුප බැර කිරීම සඳහා තවත් අය සමග බද්ධ ගිණුම් (Joint Accounts) පවත්වාගෙන යනවා. සමහර විට ගිණුම් හිමියන් දෙදෙනා ම විදේශ ගත වෙලා. විදේශයක ජීවත් වන විශ්‍රාමිකයාගේ වැටුප ලබා ගන්නේ ලංකාවේ වෙසෙන වෙනත් පුද්ගලයෙක්. මෙවැනි අවස්ථා වලදී විශ්‍රාමිකයා ජීවත් සිටින්නේද යන්න සනාථ කර ගැනීම ඉතාම වැදගත් වෙනවා.

විදේශවල ජීවත්වන විශ්‍රාමිකයන් තම ගැටලු වලට දුරකථන ඇමතුම් ලිපි හෝ ඊ මේල් මගින් විසඳුම් ලබා ගැනීමට උත්සාහ කළත් ඊට පිළිතුරු ලබාගැනීම අසීරු බවයි බොහෝ දෙනා පවසන්නේ. මේ තත්වය පිළිබඳව ඔබේ අදහස කුමක්ද?

ශ්‍රී ලංකාවේ විශ්‍රාමිකයන් ලක්ෂ හයෙන් 30000 ක්ම ජීවත් වන්නේ විදෙස් ගතවයි. ඉන් වැඩිම සංඛ්‍යාවක් ජීවත්වන්නේ ඔස්ට්‍රේලියාවේ යි. රජයේ ආයතන වල පරිපාලනයය කටයුතු සඳහා වෙන් වන්නේ සීමිත මුදලක් විදේශ ලිපි වලට පිළිතුරු සපයීමට අවශ්‍ය මුද්දර ගාස්තු දුරකථන ඇමතුම් ගාස්තු සඳහා ගධලු පවතිනවා. එසේ වුවත් සේවා දායකයන් වෙත උපටිම සේවයක් සැළසීමට ප්‍රදේශීය ලේකම් කාර්යාල වල නිළධාරීන් කටයුතු කරන බවත් සඳහන් කළ යුතුයි. විශ්‍රාම වැටුප් ජනරාල් කාර්යාලයේ විදුයත් තැපෑලට එවන සෑම පණිවිඩයක්ම අදාල අංශ වලට යොමු කෙරෙන අතර ඒවාට පිළිතුරු සපයීමට ද කටයුතු යොදා තිබෙනවා. එමෙන්ම ප්‍රධාන කාර්යාලයට ඔබ ලිඛිතව කරුණු ඉදිරිපත් කරන්නේ නම් ඔබේ නම ලිපිනය විදුයත් තැපෑලේ ලිපිනය විශ්‍රාමික/වැන්දඹු අනන්දරු අරමුදල් අංකය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය බැංකු ගබඩාව හා ගිණුම් අංකය යන තොරතුරු ද සඳහන් කර යැවීමෙන් අදාල පියවර ගැනීම පහසු වෙනවා. www.pensions.gov.lk කියන වෙබ් අඩවියට ගොස් විශ්‍රාම වැටුප් සංගුනය සහ අදාල සියලු චක්‍රලේඛ ඔබට කියවා බැලිය හැකි ය. එමෙන්ම දෙපාර්තමේන්තුවේ විදුයත් තැපෑලෙ pensions@sltnet.lk වෙයි

සිය කෙට් සංචාරයේදී සන්නස වෙනුවෙන් සාකච්ඡාවක් ලබාදීම පිළිබඳව විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් කේ ඒ සිලකරත්න මහතාට ස්තූතියි.